# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2135/18 - 2019 අගෝස්තු මස 05 වැනි සඳුදා - 2019.08.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංක* : LAN/ACQU/NAVPE/D31/02.
*ඉඩම් අමාත්‍යාංශ අංක* : 4-3/4/2017/D/520.

ප්‍රසිද්ධ මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ (පරිච්ඡේදය 460) පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තරය :*

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලයිපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පේතාලයි 205බී ග්‍රාම සේවා වසමේ කරුන්කාලිචෝලයි ගම්මානේ පිහිටුවා ඇති මඩකලපුව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධ්‍යක්ෂක ජනරාල්තුමා විසින් සකස්කරන ලද PP/මඩ/2793 අංක දරන හා 2019.06.25 දිනැති මුල ප්‍රස්ථාරයේ දක්වන 1.0117 හෙක්ටයාර් ප්‍රමාණයෙන් යුතු පහත සඳහන් ඉඩම් කැබැල්ල.

**කැබලි අංක 01**

ඉඩමේ නම: වෙල්ලයඩිපූවල්; ඉඩමේ විස්තරය: ස්ථිර ගොඩනැගිලි, තල් ගස් 18ක්, පොල් ගස් 10ක්, අඹ ගස් 01ක් හා ලිං 02ක්; අයිතිවාසිකම් ඉල්ලන්නා: එන්. වී. බී. ජෝන්පිල්ලයි; ප්‍රමාණය: හෙක්ටයාර් 1.0117.

ඉඩමේ මායිම්:

*උතුරට*: වාලච්චේනයි ගංගා හා එන්. වී. බී. ජෝන්පිල්ලයිගේ වෙල්ලයඩිපුවල් වත්ත; *නැගෙනහිරට*: එන්. වී. බී. ජෝන්පිල්ලයිගේ වෙල්ලයඩිපුවල් වත්ත; *දකුණට*: එන්. වී. බී. ජෝන්පිල්ලයිගේ වෙල්ලයඩිපුවල් වත්ත, පාර (ප්‍රාදේශීය සභා) අයිතිවාසිකම් නොමැති වෙල්ලයඩිපුවල් වත්ත; *බටහිරට*: පාර (ප්‍රාදේශීය සභා), අයිතිවාසිකම් නොමැති වෙල්ලයඩිපුවල් වත්ත හා වාලච්චේනයි ගංගාව.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.09.27 වැනි දින පෙ.ව. 10.00ට කෝරලයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2019.09.20 වැනි දිනට මත්තෙන් කෝරලයි පත්තු ඉඩම්/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
කෝරලෙයිපත්තු,
වාලච්චෙනෙයි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කෝරලයිපත්තු.

08 - 744